දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

ළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, ரிபோபுர, ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යයේ දැක්ම" -செளபாக்கியமான எதிர்காலத்திற்காக- "For a prosperous future"

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/07/DCC/වාර්තා/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2024.04.08

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2024.03.28*</u>**

*2024.03.28* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03.ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 14 ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

එච්.පී.සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

පිටපත්:-

01.ගරු දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02.ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමල් රාජපක්ෂ මැතිතුමා - කරු.දැ.ගැ.ස.
03.ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස
04.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

| | | | |
|---|---|---|---|
| ...ත්‍රික් ලේකම් / ...மாவட்ட செயலாளர் / ...istrict Secretary – 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) – 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) – 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant – 047 2256246 |
| ...ධ්‍යක්ෂ (කෘෂිකර්ම) / ...ணிப்பாளர் (விவசாயம்) / ...irector (Agriculture) – 047 3628890 | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) – 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary – 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer – 047 2256285 |
| ...ර්යාලය / ...லுவலகம் / ...ffice | ෆැක්ස් / தொலை நகல் / Fax – 047 2256235, 047 2256247 | ඊ මේල්/ மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com<br>වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk | |

CamScanner

# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම</u>
## <u>2024.03.28</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024.03.28 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සම සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | කඩවර වැව පිටාර ගැලීම වැළැක්වීම සම්බන්ධව මේ දක්වා යෝජනා ඉදිරිපත් නොවීම | මහවැලි අපවහන ජලය කඩවර වැවට වැටීම නිසා එම වැව පිටාර ගැලීම හේතුවෙන් කුඹුරු අක්කර 400 -500 ක් පමණ ප්‍රමාණයක් ජලයෙන් යටවන බවට අදහස් ඉදිරිපත් විය. මුල් කාලයේදී එම බිම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි මුදල් ලබා දීම සිදු කල ද මෑත කාලීනව ඒ සඳහා විසඳුමක් ලබා නොදීම සම්බන්ධව අදහස් දක්වන ලදී.<br>මේ වන විටත් මහවැලි අධිකාරිය මගින් සම්පූර්ණ ඇස්තමේන්තුවක් සාදා ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇති බව දන්වන ලදී. | මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ව ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් වාරි මාර්ග අධ්‍යක්ෂ/<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය/<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට/ සූරියවැව |
| 02 | හම්බන්තොට මහ නගර සභාව මගින් ඉදිරිපත් කරන ලද ගැටළු | පසුගිය වැසි සමය සමඟ බොරළු යොදා සකසා ඇති මාර්ග ආපදාවට ලක්ව ඇති බැවින් ඒවා නැවත සකස් කිරීමට අවශ්‍ය බොරළු හම්බන්තොට කැලියපුර ප්‍රදේශයෙන් ලබා ගත හැකි බවට කරුණු ඉදිරිපත් විය. බොරළු ලබා ගැනීමේදී රාජ්‍ය භාගය ලෙස කියුබ් එකක් සඳහා රු.750.00 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු වුවත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සභාව සතුව නොමැති බව ප්‍රකාශ කරන ලදී. | ආයතන සතුව ඇති ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකල යුතු බවත්, බොරළු ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති නම් ඒ සඳහා අවශ්‍ය බොරළු කියුබ් ප්‍රමාණය ගණනය කර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පළාත් සභාවෙන් ඉල්ලීම් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට/ තංගල්ල<br><br>නාගරික කොමසාරිස් මහ නගර සභාව |
| 03 | තංගල්ල ධීවර වරායේ අයිස් නිෂ්පාදනාගාරය සම්බන්ධ ගැටළුව | අයිස් නිෂ්පාදනාගාරයේ අයිස් නිෂ්පාදන යන්ත්‍රයෙන් අධික ශබ්දයක් නිකුත් වන බව පවසමින් පුද්ගලයින් දෙදෙනෙක් දිගින් දිගටම කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, නගර සභාවේ ලේකම් සහ වරාය කලමනාකරු එක්ව සාකච්ඡාවක් සිදුකල ද ඒ සඳහා විසඳුමකට ඒමට නොහැකි වූ බවට කරුණු ඉදිරිපත් විය. විශේෂයෙන්ම මත්ස්‍ය නිෂ්පාදනය සඳහා පවතින අධික ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීම සඳහා අයිස් නිෂ්පාදනය වැඩි කළ යුතු | මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මෙම ධීවර වරාය මගින් සැලකිය යුතු දායකත්වයක් සපයන බැවින් මත්ස්‍ය නිෂ්පානයට බාධා සිදු නොවිය යුතු බවත්, ස්ථිර විසඳුමක් ලබා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශයට මෙම ගැටළුව යොමු කරන ලෙසත් තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය/<br><br>කළමනාකරු තංගල්ල ධීවර වරාය<br><br>ලේකම්,නගර සභාව තංගල්ල |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බැවින් ධාරිතාව ඉහළ Compressor එකක් භාවිත කරන බවත්, ධාරිතාව ඉහළ අගයක් ගන්නා බැවින් ඒ සඳහා පරිසර අධිකාරියේ නිර්දේශ ලබා දී නොමැති බවත් ප්‍රකාශ විය. එමෙන්ම පැමිණිලි ඉදිරිපත් කරන පුද්ගලයින්ගේ නිවෙස් අයිස් යන්ත්‍රාගාරයට සැලකිය යුතු දුරකින් පිහිටා තිබෙන බවත් ඔවුන් ඉදිරිපත් කරන ආකාරයේ අධික ශබ්දයක් සත්‍ය වශයෙන්ම පවතින්නේදැයි ගැටළුවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| 4.1 | වල්සපුගල ඒකාබද්ධ පාරිසරික ගොවි සංසදය මඟින් ආරක්ෂිත අලිවැට ඉදිකිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම | එල්ලෙන විදුලි වැට මේ වන විට 3km ක වැඩ අවසන්ව ඇති බවත්, ඉතිරි කොටස සඳහා අවශ්‍ය කණු 200 ක පමණ ප්‍රමාණය විදුලිබල හා බල ශක්ති රාජ්‍ය ඇමතිතුමා විසින් ලබා දීමට කටයුතු කරන බවට ප්‍රකාශ කරන ලදී. | ගොවි සංවිධානය වෙත අවශ්‍ය කණු සපයා දෙමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලෙස සූරියවැව ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් දෙන ලදී. | ප්‍රධාන විදුලි ඉංජිනේරු හම්බන්තොට / ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට/ සූරියවැව |
| 4.2 | අධිවේගී මාර්ගයේ කල්වට් හරහා වන අලි ගමන් කිරීම | වන අලින් එහා මෙහා ගමන් කිරීම වැලැක්වීම සඳහා කල්වට් වසා තැබීම කළ නොහැකි බවත් ඔවුන්ට ගමන් කළ හැකි වන පරිදි එල්ලෙන විදුලි වැටක් සකස් කළ හැකි බවත් එහි නඩත්තු කටයුතු සිදු කිරීමේ හැකියාවක් තමන්ට නොමැති බවත් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය විසින් දැනුම් දෙන ලදී. | අදාළ ගොවි සංවිධාන මගින් නඩත්තු කටයුතු සිදු කර පවත්වා ගත යුතු බවට තීරණය විය. | ඉංජිනේරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය / ප්‍රධාන විදුලි ඉංජිනේරු හම්බන්තොට/ ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට/ සූරියවැව සහකාර අධ්‍යක්ෂ වනජීවී |
| 05 | අපද්‍රව්‍ය හා අපජලය වගා බිම් වලට බැහැර වීම. (අම්බලන්තොට ජේරපුත්ත ගොවි සංසදය) | අම්බලන්තොට නගරයේ වෙළෙඳසැල්වල ගලි බට සහ වෙනත් අපද්‍රව්‍ය වාරි ඇලක් වන ජේරපුත්ත RD 03 ඇල මාර්ගයට එක්වෙමින් කෘෂි බිම් කරා අපද්‍රව්‍ය ගලා යන බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව , නගර සභාව සහ ප්‍රාදේශීය ලේකම් එක්ව සාකච්ඡාවක් සිදු කර මෙම ගැටළුව විසඳා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | අධ්‍යක්ෂ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට/ ලේකම් ප්‍රාදේශීය සභාව අම්බලන්තොට |
| 06 | සංවර්ධන වැඩසටහන් වලට අදාළ ප්‍රගතිය ඉදිරිපත් කිරීම | | | |
| 6.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 ට අදාළ ව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් කළ | විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 - හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා වෙන්ව ඇති මිලියන 402 ට අදාළ ව්‍යාපෘති යෝජනා 912ක් අනුමත කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත | සංශෝධන කඩිනමින් ලබා දී සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | යෝජනා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | යොමු කර ඇති බවත්, ඒ අතරින් මිලියන 371 කට අදාළ යෝජනා 880ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත්, එම යෝජනා 880 සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බැවින් ප්‍රදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීමට කටයුතු කරන බවත් දන්වන ලදී. ඉතිරි මිලියන 31 ට අදාළ යෝජනා ඉදිරියේදී ලැබීමට නියමිත බවත් දැනට අනුමැතිය ලබා දී ඇති ව්‍යාපෘති යෝජනාවල සංශෝධන පවතී නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල නිර්දේශ සහිතව කඩිනමින් ලබා දෙන ලෙසත් ව්‍යාපෘති සංශෝධනය කළ හැකි අවසාන දිනය මෙම වර්ෂයේ අප්‍රේල් 30 දින බවත් ප්‍රකාශ කරන ලදී. | | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු හම්බන්තොට |
| 6.2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2024 | මීට අදාළව සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයෙකු සඳහා රු.මිලියන 50ක් බැගින් දිස්ත්‍රික්කය සඳහා රු.මිලියන 250ක ප්‍රතිපාදන ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යංශය මගින් ලබා දෙන බව දන්වා ඇති බවත්, විදුලිබල හා බල ශක්ති රාජ්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලැබී ඇති බවත්, කෘෂිකර්ම ඇමතිතුමාගේ යෝජනා සහ නියෝජ්‍ය කථානායකතුමන්ගේ යෝජනා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී,<br>එම යෝජනා සඳහා ඇස්තමේන්තු ලැබීමෙන් පසු අමාත්‍යංශය වෙත යොමු කර අදාළ ප්‍රතිපාදන ලබා ගතහැකි බවට කරුණු ඉදිරිපත් විය.<br>ව්‍යාපෘති ඇස්තමේන්තු සකස් කිරීමට අදාළ Rate සහ මිල විශ්ලේෂණයන් මේ වන විටත් තාක්ෂණික නිලධාරීන් වෙත යොමු කර ඇති බවත් ,එහිදී යම් ගැටලුවක් ඇති වන්නේ නම් දිස්ත්‍රික් ඉංජිනේරු මගින් පැහැදිලි කර ගැනීමට හැකි බවද ප්‍රකාශ කරන ලදී. | ඇස්තමේන්තු කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන්)<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු හම්බන්තොට |
| 07 | ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි නවීකරණ ගම්මාන වැඩසටහන පිළිබඳ කෙටි දැනුවත් කිරීමක්. | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති 02ක් ආරම්භ කර ඇති අතර ඒ සඳහා ගොවීන් 18 දෙනෙකු තෝරාගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී. අඟුණුකොළපැලැස්ස කොට්ඨාශයේ ගොවීන් 110ක් තෝරා ගනිමින් අක්කර 110 ක අපනයනය කිරීමේ අරමුණින් ඇඹුල් කෙසෙල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරන බවත්, ඒ සඳහා කච්චිගල්ආර ප්‍රදේශයේ සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.<br>මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා | කෘෂි නවීකරණ ගම්මාන වැඩසටහන අලුතින් ආරම්භ කිරීමට යෝජිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් ඒ සඳහා අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | - ප්‍රාදේශීය ලේකම් සූරියවැව/ අඟුණුකොළපැලැස්ස/ කටුවන/ ඕකෙවෙල/ ලුණුගම්වෙහෙර |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඔකෙවෙල, කටුවන, ලුණුගම්වෙහෙර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 තෝරා ගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී. | | |
| 08 | සුහුරු ව්‍යාපෘතිය සම්බන්ධ අදහස් ඉදිරිපත් කිරීම | කෘෂිකර්ම නවීකරණය යටතේ ගොවි මහතුන්ගේ ප්‍රධාන ගැටලුව වන අධික විදුලි බිල් ගෙවීමට සිදු වීම වැලැක්වීම සඳහා සූර්ය බල ශක්ති ඒකක 10 ක් ලබා දී ඇති බවත්, තවත් 10 දෙනෙකු සඳහා සූර්ය බල ශක්ති ඒකක ලබා දීමට කටයුතු කරන බවට කරුණු දක්වන ලදී.<br>බිංදු ජල සම්පාදන පද්ධති සහ විසිරුම් ජල සම්පාදන පද්ධති ලබා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක වන අතර ජුල්ගමුව සහ කාවන්තිස්සපුර යන ගම්මාන දෙක යටතේ ආදර්ශන 324 ක් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම මගින් සාර්ථක නවීකරණය වූ ගොවි පවුල් සංඛ්‍යාවක් බිහි කිරීම අරමුණ බව පෙන්වා දෙන ලදී.<br>කෘෂි කාර්මික වැඩසටහන් පළාත් හා අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ද, වාරිමාර්ග වැඩ සටහන් පළාත් වාරිමාර්ග, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ ගොවි සංවිධාන යටතේ අධීක්ෂණය වන බව ප්‍රකාශ කරන ලදී. | ක්ෂේත්‍ර නිලධාරීන් විසින් සෑම ගමකම සිදුවන ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂා කර ඒවායේ සාර්ථක අසාර්ථක භාවය පිළිබඳ වාර්තාවක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට/ලුණුගම්වෙහෙර/ තිස්සමහාරාම<br>නි.අධ්‍යක්ෂ (දේශගුණික සුහුරු ව්‍යාපෘතිය) |
| 09 | රිදියගම ව්‍යාපාරයේ 2024 යල් කන්නය ආරම්භ කිරීම සඳහා නුසුදුසු අවස්ථාවක ජලය නිකුත් කිරීම නවතා දෙන ලෙස ඉල්ලීම කිරීම සම්බන්ධව | අප්‍රේල් මාසයේ පළමු දින සිට ගොවි බිම් සඳහා ජලය නිකුත් කිරීමට නියමිත බැවින් රිදියගම ව්‍යාපාරයේ අක්කර 500කට ආසන්න ප්‍රමාණයක් විනාශ වීමට ඉඩ ඇති බැවින් ජලය ලබා දීම ප්‍රමාද කරන ලෙස ඉල්ලීම් කර ඇත. නමුත් පවතින වියළි කාලගුණ තත්ත්වය මත ජල හිඟයක් ඇතිවිය හැකි බැවින් අප්‍රේල් 01 සිට ජලය ලබා දීමට තීරණය කර ඇති බවත්, මෙම ගොවීන් සඳහා මාස 03 වී ප්‍රභේදයක් හෝ මුං වගාවේ නිරත වන ලෙස මුලින් ලබා දී තිබූ කෘෂි කාර්මික උපදෙස්වලට පටහැනිව කටයුතු කර ඇති බැවින් අස්වැන්න නෙලා ගැනීම ප්‍රමාද වී ඇති බවත් සමස්ථ ප්‍රදේශය අක්කර 500 ක් නොව අක්කර 200ක පමණ ප්‍රමාණයක් වන බවත් දන්වන ලදී.<br>**AT** 362 රතු වී ප්‍රභේදය අස්වැන්න ඉහළ අගයක් ගැනීම නිසා එම වර්ගය අම්පාර, පොළොන්නරුව වැනි ප්‍රදේශවල පවා ව්‍යාප්තව ඇති බවත්, එබැවින් ඉදිරියේදී **AT** 362 අලෙවි කර ගැනීමේ දුෂ්කරතා ඇති විය හැකි බැවින් ඒ පිළිබඳ | මහ කන්නය සඳහා ජලය ලබා දීමේදී දැනට අස්වනු නෙලීමට ඇති කුඹුරු ඉඩම් ආවරණය කර ගනිමින් ජලය ලබා දිය යුතු බැවින් ඒ පිළිබඳව ප්‍රායෝගිකව සොයා බලා කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | වාරි මාර්ග අධ්‍යක්ෂ/<br>ගොවිජන සේවා කොමසාරිස් හම්බන්තොට<br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට/ සූරියවැව |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අවධානය යොමු කළ යුතු බව දැනුම් දෙන ලදී. දැනටමත් අඟුණුකොළපැලැස්ස ප්‍රදේශයේ කිරි සම්බා වී වර්ගය ආදර්ශනයක් ලෙස වගා කරන බවත්, **AT** 378 සුදු වී ප්‍රභේදය ද එම ගොවීන්ට හඳුන්වා දී තිබෙන බවත් ඒ සඳහා අවශ්‍ය බිත්තර වී නිෂ්පාදනය කර ඇති බවත් දන්වන ලදී. | | |
| 10 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්දපෝෂණ තත්ත්වය සහ කෘෂ බව පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම - දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවුරුදු 05ට අඩු දරුවන්47,000 ක් පමණ සිටින බවත්, දිස්ත්‍රික්කයේ පෝෂණ තත්ත්වය තක්සේරු කිරීම සඳහා පවුල් සෞඛ්‍ය නිලධාරී කොට්ඨාශ 236 තුළ ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදී.<br>අවුරුදු 5 ට අඩු දරුවන්ගේ මධ්‍යස්ථ ත්‍රීව්‍ර මන්දපෝෂණය ලුණුගම්වෙහෙර ,අම්බලන්තොට, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැඩි අගයක් ගන්නා බවත්, උග්‍ර ත්‍රීව්‍ර මන්දපෝෂණය තිස්සමහාරාම සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැඩි බවත්, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්දපෝෂණය අඩු මට්ටමක පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබාදීම ඉතා වැදගත් බැවින් එම ආහාර වේල තම නිවසින්ම ලබා දී පෙ.ව.11 ට පමණ රජයෙන් දෙන ආහාර වේල ලබාදීම වඩාත් සුදුසු බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br>දරුවන්ගේ බර වර්ධනය කර ගැනීම සඳහා අමතර ආහාර වේලක් ලබා දීම සුදුසු වුවද ඉතා දුෂ්කර ගම්මානවල සිට පැමිණෙන සහ උදෑසන 6 හෝ 6.30 ට පමණ නිවසින් පිටත්වන දරුවන් නිරාහාරව සිටීම නිසා ක්ලාන්ත වන බවත්, රජයෙන් ලබා දෙන ආහාරවේල උදෑසන 11 ට පමණ ලබා දෙන තුරු කුසගින්නේ අධ්‍යාපන කටයුතු සිදු කළ නොහැක් බැවින් එම ආහාර වේල උදෑසන 9 ට පෙර ලබා දීම සුදුසු බවටද කරුණු ඉදිරිපත් විය. මේ සම්බන්ධව සාකච්ඡා කර පොදු තීරණයක් ගැනීම කළයුතු බවට අදහස් ඉදිරිපත් කරන ලදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් නොව අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්වලද මෙම තත්ත්වය උද්ගතව ඇති බවට අදහස් ඉදිරිපත් විය. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් කරනු ලබන සමීක්ෂණයේ වාර්තාව ලබා දෙන ලෙසත්, මෙම අතිරේක ආහාර වේල ලබාදීමට සුදුසු වේලාවක් තීරණය කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශ හා අධ්‍යාපන අංශ එක්ව තීරණය කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්<br><br>ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 11 | "උරුමය" ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම | සින්නක්කර ඉඩම් ලබා දීමේ වැඩටහන "උරුමය" වැඩසටහන ලෙස හඳුන්වන බවත් අදියර 03 ක් යටතේ මෙම වැඩ සටහන ක්‍රියාත්මක වන බවත්, පළමු අදියර යටතේ සින්නක්කර ඔප්පු 427ක් ජනාධිපතිතුමන් විසින් බෙදා දුන් බවටත් කරුණු ඉදිරිපත් විය. දෙවන අදියර යටතේ නිරවුල්ව මැනුම් කර ගල් දමා ඇති ඉඩම් රජයට භාර දී මෙම වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පු ලබා ගැනීම සහ තෙවන අදියර යටතේ ගැටලු හඳුනා ගනිමින් එම ගැටලු නිරවුල් කිරීමෙන් පසු සින්නක්කර දීමනාපත්‍ර ලබා දීම සිදු කල හැකි බව ප්‍රකාශ කරන ලදී.<br>තවද තිස්සමහාරාම කොම්පැනිවත්ත කුඹුරු සඳහා ගාස්තු අයකරන බවත්, ගාස්තු අයකිරීමකින් තොරව ගොවීන් වෙනුවෙන් එම ඉඩම් ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. නමුත් මෙම ඉඩම් **LRC** එකට අයත් බැවින් එම ඉඩම් සඳහා ප්‍රවේනිය වෙනුවෙන් පර්චස් එකක් සඳහා රු.100.00 ක මුදලක් අයකරන බවත් නොමිලේ ලබා දීම කළ නොහැකි බවත් දන්වන ලදී. | උරුමය වැඩ සටහන යටතේ ඉඩම් මැනීමේ කටයුතු කඩිනම් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.<br><br>සාකච්ඡාකර විසඳුම් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>මිනින්දෝරු අධිකාරිය<br><br>අධ්‍යක්ෂ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය |
| 12 | හම්බන්තොට මයුරපුර කෘෂි කර්මාන්තය ආශ්‍රිත සංචාරක කලාපයක් පිහිටුවීම | මගී නෞකා මගින් පැමිණෙන සංචාරකයින් ඉලක්ක කර ගනිමින් මයුරපුර කෘෂි කර්මාන්ත ආශ්‍රිත සංචාරක සහ විනෝද උද්‍යානයක් සහ හස්ත කර්මාන්ත ප්‍රදර්ශනාගාරයක් විදේශ සංචාරකයින් සඳහා පිහිටුවීම පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී.<br>උද්‍යානය තුළ විශේෂයෙන්ම විදේශික සංචාරකයින් සඳහා සහභාගීත්වය තුළින් අත්දැකීම් ලබා දීම සඳහා සංස්කෘතික මධ්‍යස්ථානයක්, කුළුබඩු උද්‍යානයක්, විනෝද වීමේ අවස්ථා, අත්කම් සැමරුම් භාණ්ඩ අලෙවිසැලක් සහ ජල ක්‍රීඩා සඳහා අවස්ථාවන් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත්, ඩොලර් මිලියන 03ක් ආයෝජනය කරමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු ඉඩමක් තෝරා ගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී.<br>ප්‍රදේශයේ අත්කම් නිෂ්පාදන සිදුකරන පුද්ගලයින් සඳහා ලක් ආකේඩ ආයතන මගින් අවශ්‍ය සහන ලබා දී නිෂ්පාදන මිලදී ගැනීමට කටයුතු කරන බව ද ප්‍රකාශ කරන ලදී.<br>මෙම ව්‍යාපෘතිය මගින් විශේෂයෙන්ම | ප්‍රදේශයේ දැනට පවතින නිෂ්පාදන මෙමඟින් වැඩි දියුණු වියයුතු බැවින් ප්‍රාදේශීය ලේකම්රුන් සමග සාකච්ඡා කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.<br><br>මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේදි ප්‍රාදේශයේ ජනතාවට සහන සහ රැකියා අවස්ථා ලබාදීම සම්බන්ධ කොන්දේසියක් ගිවිසුමටද ඇතුළත් කරන ලෙසට උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය /<br><br>නි.අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය /<br><br>ප්‍රාදේශීය ලේකම්වරුන් |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අපේක්ෂා කරනුයේ හම්බන්තොට ජාත්‍යන්තර වරාය හරහා නෞකා මගින් පැමිණෙන සංචාරකයින් බැවින් වරායට සමීපව ව්‍යාපෘතිය පිහිටා තිබීම අවශ්‍ය බව ප්‍රකාශ විය. | | |
| 13 | පාරිසරික හා නවෝත්පාදන නිෂ්පාදනයන්, වස්ත්‍ර සිලෝන් ආයතනය සහ නිෂ්පාදනයන් හඳුන්වා දීම | කෙසෙල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා වසර 9 1/2 ක පලපුරුද්දක් තිබෙන බවත්. හම්බන්තොට බඳගිරිය ප්‍රදේශයෙන් බද්දු පදනම යටතේ ගොඩනැගිලි ලබා ගෙන රු.මිලියන 6.8 ක ආයෝජනයක් දැනටමත් සිදු කර ඇති අතර කෙසෙල් කෙඳි උපයෝගී කර ගනිමින් ආහාර ඇසුරුම්. අත්කම් නිර්මාණ ,සනීපාරක්ෂකතුවා නිපදවීම කරන බවත් අමු ද්‍රව්‍ය ලෙස කෙසෙල් කඳන් හා 2nd **quality** කෙසෙල් යොදා ගන්නා බවත් මාසික අවශ්‍යතාව ටොන් 50ක පමණ වන බවත් ප්‍රකාශ විය. තවද විදුලිය කඩිනමින් ලබා ගැනීමේ අවශ්‍යතාවක් පවතින බවත් අමුද්‍රව්‍ය සපයා ගැනීම අත්‍යවශ්‍ය බවත් පෙන්වා දෙන ලදී. එමෙන්ම දැනටමත් සෘජු රැකියා 137ක් පමණ සපයා ඇති අතර කෙසෙල් අපනයනය සඳහා කච්චිගල්ආර ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන අපනයන ව්‍යාපෘතියෙන් ඉවත් කරන කෙසෙල් මෙහි අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීමේ හැකියාවක් පවතින බවත් දන්වන ලදී. | කෙසෙල් ආශ්‍රිත නිෂ්පාදනවල **sample** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලෙසත්, අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිඛිතව දැනුම් දෙන ලෙසට උපදෙස් දෙන ලදී | ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 14 | අස්වැසුම වැඩසටහනේ දිස්ත්‍රික් ප්‍රගතිය ඉදිරිපත් කිරීම | 2024.03.28 දින වන විට පළමු වටයේ ප්‍රගතිය ලෙස සංගණනය කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව 111,835 ක් ද. මේ වන විට තෝරා ගෙන ඇති මුළු අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 62318ක් ද අභියාචනා ලැබී ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 37828 ක් ද විරෝධතා ලිපි යොමු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5293 ක් ද වන අතර දෙවන වටයේ ලැබී ඇති නව අයදුම්පත් සංඛ්‍යාව 10656ක් ද පද්ධතියට ඇතුළත් කර ඇති අයදුම්පත් ගණන 5729 ක්ද වන බව ප්‍රකාශ කරන ලදී.<br>අස්වැසුම ප්‍රතිලාභ ලබා දීමේදී ලැබිය යුතුම පිරිසක් අත්හැරී ඇති බැවින් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් වඩාත් සුදුසු පුද්ගලයින් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. | මෙම ක්‍රියාවලිය ඉතා සාධාරණව කලයුතු බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසට උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 15 | දෙබරවැව ජාතික පාසලේ 6 ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කිරීමේදී | පාසලේ 6 ශ්‍රේණිය පන්ති කාමර 7 ක් සඳහා ඇතුළත් කළ හැකි සිසුන් ප්‍රමාණය 315 ක් වන අතර ශිෂ්‍යත්වය සමත් | පෙර වර්ෂවල 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයට අනුව මෙම | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | මුහුණපෑමට සිදුවන ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීම | දරුවන් සහ පෝෂිත පාසලේ සියලුම දරුවන් ඇතුළත් කර ගැනීමේදී 315ට වඩා වැඩිවන බැවින් ගැටලුකාරී තත්ත්වයක් මතුවන බැවින් ශිෂ්‍යත්වය අසමත් දරුවන් සඳහා වෙනත් පාසලක් ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳ කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම මෙම ගැටලුව සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින්ද පරීක්ෂණයක් පවත්වා ඇති බවත් එහි තීරණ මේ දක්වා ලබා දී නොමැති බවත් දැනුම් දෙන ලදී.<br>ජාතික පාසල් සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දියයුතු බවත් , පළාත් සභා පාසල්වල ගුරු පුරප්පාඩු හෝ වෙනත් අඩුපාඩු ඇත්නම් ඒවා සකස් කිරීමේ හැකියාව පළාත් සභාවට පවතින බැවින් අවශ්‍යතාවයන් කඩිනමින් පළාත් සභාවට යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | වර්ෂයේ ද දරුවන් බඳවා ගැනීම සුදුසු බවත්, 2025 වර්ෂයේ සිට දෙමාපියන් දැනුවත් කර ශිෂ්‍යත්වය සමත් දරුවන් පමණක් බඳවා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට උපදෙස් ලබාදුනි.<br>එමෙන්ම මෙම ජාතික පාසලට සමීපව ඇති පළාත් සභා පාසල්වල අඩුපාඩු කඩිනමින් දන්වන ලෙසත් උපදෙස් දුනි. | හම්බන්තොට |
| 16.1 | පුනරුත්ථාපන වැඩසටහන්වල(යුක්තිය මෙහෙයුම) ප්‍රගතිය | 2024 වර්ෂයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන 19ක් කේන්ද්‍ර කර ගනිමින් යුක්තිය මෙහෙයුම සිදු කළ බවත්, මෙහිදී හෙරොයින් වැටලීම් මගින් 588 දෙනෙක් සහ හෙරොයින් ග්‍රෑම් 746 මිලිග්‍රෑම් 350 ප්‍රමාණයක්, අයිස් වැටලීම් 159 ක් සිදු කර ග්‍රෑම් 179 මිලි ග්‍රෑම් 365 ක්,ගංජා මුළු වැටලීම් 1556 ක් සහ ගංජා ගස් 339,650 ප්‍රමාණයක්, ගංජා සුරුට්ටු 11ක්, මදනමෝදක ගුලි 130ක්, මත් කරල් 699ක් ,මත්පෙති 727ක්, ලියාපදිංචි නොකල බීඩි 2100, හැෂ් මිලිග්‍රෑම් 110ක්, හූෂ් ගස් 17ක් අත් අඩංගුවට ගෙන ඇති අතර මේ වන විට සැකකරුවන් 2358 ක් හඳුනා ගෙන ඇති අතර ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා 06 ක් හඳුනා ගෙන ඇති බවත්, නීති විරෝධීව විශාල වශයෙන් වත්කම් ඉපයූ 10 දෙනෙක් හඳුනා ගනිමින් විමර්ශන ආරම්භ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී . තමන්ගේ වසම්වල නීති විරෝධී ක්‍රියා සිදුවනවා නම් තවදුරටත් මැඩ පැවැත්වීමට මෙය හොඳ අවස්ථාවක් කර ගනිමින් කොට්ඨාශභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් වෙන් කරන ලද දුරකථන අංකය සඳහා ඇමතු ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | ග්‍රාමීය සිවිල් ආරක්ෂක කමිටු ශක්තිමත් කරමින් මත් ද්‍රව්‍ය තුරන් කිරීමේ වැඩසටහනට සහාය දක්වන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/<br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br>බන්ධනාගාර අධ්‍යක්ෂ වීරවිල/ අගුණුකොළපැලැස්ස |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 16.2 | බන්ධනාගාර පුනරුත්ථාපන වැඩසටහන්වල ප්‍රගතිය ( අඟුණුකොළපැලැස්ස/ වීරවිල ) | යුක්තිය මෙහෙයුමත් සමඟම බන්ධනාගාර ගත වන පිරිස් වැඩි වන බවත්, දැනට 1400ක පමණ රැඳවියන් ප්‍රමාණයක් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරගතව සිටින බවත් මින් 90% ක් පමණ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමු වූවන් බවත් දන්වන ලදී. එනිසාම ඉදිරියේදී ආයතනය තුළ ඉඩ පහසුකම් සහ යටිතල පහසුකම් ලබා දීම අපහසු වන බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. පුනරුත්ථාපනය වන රැඳවියන් සඳහා ආගමික, සංස්කෘතික, ක්‍රීඩා, වෘත්තීය පුහුණු, වගා වැඩසටහන් සහ මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම වැලැක්වීමේ වැඩසටහන්,ක්‍රියාත්මක කරන බවත්, පුනරුත්ථාපනය වී සමාජගත වන ප්‍රජාව පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කිරීම සඳහාත්. ඔවුන් සඳහා උපදේශන වැඩසටහන් සිදු කිරීම කළ යුතු බවත් මේ සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය බවත් පැහැදිළි කරන ලදී.<br>බන්ධනාගාරය සතුව තාක්ෂණික උපකරණවල හිඟයක් පවතින බැවින් ජංගම දුරකථන ,මත්ද්‍රව්‍ය බන්ධනාගාර තුළට රැගෙන ඒම වැලැක්වීම අපහසුවී ඇති බවත් දැනුම් දෙන ලදී. වීරවිල බන්ධනාගාරයේ ද රැඳවියන් 506 ක් සිටින බවත්, ඉඩකඩ සීමිත බවත් දන්වන ලද අතර රැඳවියන් නිදහස් වූවත් නිවැරදිව සමාජගත නොවීම නිසා මුල්වරදටම නැවතත් බන්ධනාගාර ගත වීමේ ප්‍රවනතාවයක් පවතින බවත් දන්වන ලදී. | සිවිල් ආරක්ෂක කමිටු හරහා සහ ප්‍රජාවිශෝධන නිලධාරි හරහා උපදේශන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්වරුන්<br>බන්ධනාගාර අධිකාරීවරුන්<br>පොලිස් අධිකාරී තංගල්ල |
| 17 | වීරවිල ජලාශයේ ධීවර කටයු කරනු ලබන ධීවරයින්ගේ ගැටළු ඉදිරිපත් කිරීම | ධීවර රැකියා අහිමි වීම මත මෙම ජලාශයේ ධීවර කටයුතු සිදු කරන ලද ධීවරයින් තමන්ගේම ඔරු මගින් ජැකට් ලබා දී ජලාශයේ සංචාරය කර වීම සඳහා සංචාරකයින් රැගෙන යන අතර වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එම ඔරු හිමියන් වෙත රුපියල් 3000.00ක මුදලකට අවසරපත්‍රයක් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>ඔරු හිමියන් විසින් රුපියල් 4000.00 ක මුදලක් සංචාරකයින්ගෙන් අයකර ගන්නා අතර ඉන් රු.3000.00 ක් මුදලක් වන ජීවී දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට සිදු වීමෙන් ධීවර ප්‍රජාව තවත් | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නා තෙක් ඔරු හිමියන් වෙතින් මුදල් අය නොකරන ලෙසත්, ඔරු මඟින් සංචාරකයින් ජලාශය නැරඹීම සඳහා රැගෙන යන්නේ නම් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි ක්‍රියා කල යුතු බවට උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ වන්ජීවී දෙපාර්තමේන්තුව /<br>ජල ජීවී දිස්ත්‍රික් වගා ව්‍යාප්ති නිලධාරී |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අසරණ තත්ත්වයට පත්ව ඇති බවත්, ආසන්නයේ හොටෙල් සඳහා ද බලපත්‍ර ලබා දීම සඳහා අයදුම්පත් නිකුත් කර ඇති බවද ප්‍රකාශ කරන ලදී.<br><br>වීරවිල ජලාශයේ සංචාරක කර්මාන්ත විධිමත්ව සිදුකිරීමෙ අරමුණින් එම කර්මාන්තයේ යෙදෙන ඔරු වනජීවී දෙපාර්තමේ ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම්පත් ලබා දී ඇති බවත් , සංචාරකයින්ගෙන් පමණක් මුදල් අයකිරීම සිදු කල බවත්, ජාන මංකොල්ලය වැනි විවිධ අක්‍රමිකතා සිදුවීම වැලැක්වීම සඳහා මෙම ක්‍රමවේදය අනුගමනය කල බවට වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී. | | |
| 18 | අම්බලන්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් පැමිණිලි භාර නොගෙන පක්ෂග්‍රාහීව කටයුතු කිරීම සම්බන්ධ පැමිණිල්ල | පැමිණිලිකරු ගෙන්වා සාකච්ඡා කිරීමේදී දරුවකු සඳහා සිදුවී ඇති කරදරයක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට පැමිණ ඇති බවත් , මේ දිනවල නිලධාරීන් රාජකාරී කටයුතු සඳහා ආයතනයෙන් බැහැරව සිටින අවස්ථාවන් වැඩි බැවින් අතපසු වීමක් සිදුව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. | පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල |
| 19 | වලස්මුල්ල මාපිටි කන්ද ෆයිනස් වගාව ඉවත් කර විකල්ප වන වගාවක් ස්ථාපිත කිරීම. | වලස්මුල්ල මාපිටි කන්ද ෆයිනස් වගාව ඉවත් කිරීමේදී ප්‍රාදේශීය සභා මාර්ග භාවිත කිරීමට සිදුවන බවත් ප්‍රාදේශීය සභාව මගින් ඇප තැන්පත් තැබිය යුතු බවට කොන්දේසියක් ඉදිරිපත් කර තිබෙන නිසා ඒ වෙනුවෙන් මුදල් ගෙවීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. එහෙත් ඇප තැන්පත් තැබීමක් අවශ්‍යය නොවන බවත් මාර්ග භාවිතයේදී මාර්ගයට සිදුවිය හැකි හානි ප්‍රතිපූර්ණය කිරීම සඳහා එකඟතාවයක් අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදී. | මාර්ග භාවිත කිරීමේදී එම මාර්ගයේ ධාවනය කළ හැකි බර සීමාව අදාළ කර ගනිමින් සහ දැව ප්‍රවාහනයේදී මාර්ගයට හානියක් සිදුවුවහොත් එය ප්‍රතිපූර්ණය කරන බවට ලිඛිත එකඟතාවයක් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී දැව ප්‍රවාහනය කරන ලෙස දන්වන ලදී.<br>එමෙන්ම දැව ඉවත් කරන භූමිය තුල පළතුරු වර්ග ඇතුළු දැවමය වටිනා කමක් ඇති ශාක වගාකරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | දිසාවන නිලධාරී<br><br>නි.ප්‍රාදේශීය කළමනාකරු රාජ්‍ය දැව සංස්ථාව<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව කටුවන |
| 20 | සෙවන සහන ජාතික නිවාස වැඩසටහන පිළිබඳව දැනුම්වත් කිරීම - | විදෙස් දානපතියන්, පරිත්‍යාගශීලීන් ,ස්වේච්ඡා සංවිධාන හෝ ආයතනවල සහාය ඇතිව දිවයින පුරා අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටළුව විසඳීම ද සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් "සහන නිවස"නමින් නිවාස ඉදිකිරීමෙ වැඩසටහනක් ආරම්භ කිරීමට යෝජිත බව දන්වන ලදී.මෙම | අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටළුව විසඳීමට ද ඉතා හොඳ වැඩසටහනක් බැවින් සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. | සියලුම ප්‍රා දේශීය ලේකම්වරුන්<br><br>දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | නිවාස ලබාදීම සඳහා අඩු ආදායම්ලාභී සුදුසු ප්‍රතිලාභීන් ග්‍රාමීය මට්ටමින් හඳුනා ගැනීම අවශ්‍ය වන බවත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම කරන ලදී. | | අධිකාරිය |
| 21 | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගණේයාය වසමට අයත් අදල්ල තොටුපල අසල පාලම ප්‍රතිසංස්කරණය කිරීම | මෙම පාලම ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා ගාල්ල ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බවත් මෙම මාර්ගය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන වෙන් කරගැනීමේ ගැටළු පවතින බවත් දන්වන ලදී.<br><br>අදාළ ඇස්තමේන්තුව, ප්‍රතිපාදන වෙන්කර දීම සඳහා පළාත් සභාව වෙත යොමු කරන ලෙස දැන්වූ අතර ප්‍රාදේශීය සභාවලට අයත් කාපට් මාර්ග පළාත් පළාත් සභාවට පවරාදීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | අදාළ ඇස්තමේන්තුව කඩිනමින් පළාත් සභාවට යොමු කරන ලෙසත් කාපට් මාර්ග පළාත් සභාවට පවරා දීම සඳහා පළාත් පාලන ආයතනවල එකඟතාවය ලබා ගනිමින් අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දෙන ලද. | දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස්වරු න්<br><br>සියළුම ප්‍රාදේශී සභා ලේකම්වරුන් |
| 22 | GEO Goviya වැඩසටහන යටතේ කුඹුරු ඉඩම් මැනීම | සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි මෙම වැඩසටහන යටතේ කුඹුරු ඉඩම් මැනීම් කටයුතු සිදුකරන අතර ඒ.ජේ.රත්නසිරි සහ ඒ.ජේ. සංජීව යන මහත්වරුන්ගේ දැඩි විරෝධය හමුවේ එම ඉඩම් කොටස් මැනුම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව දන්වන ලදී | දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන වැඩසටහනක් බැවින් නිත්‍යානුකූලව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 23 | හම්බන්තොට මයුරපුර ප්‍රාථමික පාසලේ 2025 වර්ෂය සඳහා පන්ති පවත්වාගෙන යාමට ගොඩනැගිලි ඉඩ පහසුකම් නොමැති වීම. | මහවැලි කලාපය තුළ ඉඩම් හිමියන් පදිංචිවී සංවර්ධනය වන තෙක් ඉදිකරන ලද පාසල් ගොඩනැගිලි සහිත බිම 10 ( සෙව්) ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති අතර 2025 වර්ෂයට ප්‍රමාණවත් පන්ති කාමර නොමැති බැවින් කාලීනව පාසලේ ඉදිරි කටයුතු සඳහා භූමිය හා ගොඩනැගිලි නිදහස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලද අතර එසේම, මෙම රෙජිමේන්තුව වෙත වෙනත් ස්ථානයක් ලබා දීමට හැකියාව පවතින බව දැනුම් දෙන ලදී. | පාසලේ ඉදිරි කටයුතු සඳහා ගොඩනැගිලි සහිත බිම නිදහස් කරන ලෙසත් 10 ( සෙව්) ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව සුදුසු ඉඩමක් ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට,<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br><br>අණදෙන නිලධාරී 10 ( සෙව්) ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු ව. |
| 24 | 2024 දකුණු පළාත් සභා ප්‍රතිපාදන යටතේ මිලියන 10 සඳහා යෝජනා ඉදිරිපත් කිරීම. | මීට පෙර ඉදිරිපත් කරන ලද යෝජනා සංශෝධනය කර, ඒ සඳහා නව යෝජනා ඉදිරිපත් කර ඇති බවත් එම යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | ඒ සඳහා අදාල අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 25 | තංගල්ල බෙලිඅත්ත මාර්ගයේ සංවර්ධන කටයුතු අවිධිමත්ව හා අනාරක්ෂිතව සිදුකිරීම | මෙම මාර්ගය පටුවීමක් සිදුවී නොමැති බවත් ජනතාව අධික ලෙස ගැවසෙන අවස්ථාවලදී එම මාර්ග තදබදයක් පවතින බවත් පැහැදිලි කරන ලදී. මේ | පවතින ගස්වලට හානියක් නොවන අයුරින් එම පදික මාර්ගය පුළුල් කිරීම සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | සම්බන්ධව පැමිණිලි කිරීම | සඳහා පදික ගමන් මාර්ග සීමාව පුළුල් කිරීම අවශ්‍ය වන බවද දන්වන ලදී. | | ලේකම්, ප්‍රාදේශි සභාව - තංගල්ල |
| 26 | හ/ උඩමලල මහා විද්‍යාලයේ ගොඩනැගිලි වටා ශුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් නගර සභාවෙන් ඉල්ලුම් කිරීම | පාසලේ ගොඩනැගිලි වටා ශුද්ධ පවිත්‍ර කිරීම් කටයුතු දෙමාපියන්ට පමණක් සිදුකිරීමේ අපහසුතාවයක් පවතින බව දැනුම් දෙන ලදි. මේ සඳහා අවශ්‍යය සහයෝගය ලබා දෙන ලෙස දන්වන ලදි. මේ වන විට පුනරුත්තාපන කාලසීමාවේ පසුවන බන්ධනාගාර ගත රැඳවියන් සම්බන්ධ කර දිය හැකි බව දැනුම් දෙන ලදි.<br><br>තවද, එම පාසලේ ක්‍රිකට් තනතීරුවක් සකස්කර ගැනීම සඳහා අදාල බිමේ පවතින වලවල් ගොඩකර ඊට අවශ්‍ය පස් කියුබ 20 ක් පමණ ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් පැහැදිළි කරන ලදි. | බන්ධනාගාරයේ සහයෝගය ලබා ගෙන අදාළ කටයුතු සිදුකරගන්නා ලෙස දැනුම් දෙන ලදි.<br><br>ඊට අදාළ ප්‍රතිපාදන පළාත් සභාවෙන් වෙන්කර අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට,<br><br>බන්ධනාගාර අධිකාරී, හම්බන්තොට<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට, |
| 27 | වීරවිල හන්දියේ පවත්වාගෙන ගිය පෙට්ටි කඩය කඩා ඉවත්කර ඇති බැවින් ඒ සඳහා නව කඩ බිමක් ලබා ගැනීම. | සියක් නගර ව්‍යාපෘතිය යටතේ මෙම ස්ථානය සංවර්ධනය කර ඇති අතර මෙහි තිබූ පැරණි කඩකාමර 03ක් වෙනුවෙන් නව කඩකාමර 03 ක් ඉදිකර ප්‍රාදේශීය සභාව වෙත ලබා දුන් බවත් මේ වන විට එම ප්‍රාදේශීය සභාව විසින් එම ස්ථානයේ ව්‍යාපාර කටයුතු කල කඩහිමියන් වෙත ඒවා ලබා දී ඇති බවත් දන්වන ලදී. එමෙන්ම තවදුරටත් කඩකාමර එම ස්ථානයෙන් ලබා දීමේ හැකියාවක් නොමැති බවත් දන්වන ලදී. | ගතහැකි විකල්ප තිබේනම් ඒ පිළිබඳ සොයා බලන ලෙස උපදෙස් දෙන ලදී. | පළාත් පාලන සහකාර කොමසාරිස්<br><br>ලේකම් ප්‍රා දේශීය සභාව තිස්මහාරාම |
| 28 | උණාකුරුව උපාසක වැල්ලේ සංචාරක සුළු කර්මාන්ත කරුවන් සඳහා වෙළඳ කුටි සකසා ලබා දෙන ලෙස ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලීම. | සංචාරකයින්ගේ ඉතා ආකර්ශනීය සංචාරක ප්‍රදේශයක් ලෙස සැලකෙන මෙම ප්‍රදේශය විදේශීය සංචාරකයින් ඉලක්ක කරගනිමින් ඔවුන්ට අවශ්‍ය සේවා සපයමින් සුළු කර්මාන්ත කරුවන් 17 දෙනෙක් පමණ තම ජීවිකාව සිදුකරගෙන ජීවත්වූ බව දන්වන ලදී.එහෙත් පසුගිය දිනෙක පොලිසිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වී ඔවුන් විසින් තාවකාලිකව ඉදිකර තිබූ වෙළඳකුටි හා සංචාරකයන් විවේක ගැනීම සඳහා භාවිත කළ **Sunbed** ඉවත් කරමින් එම සුළු කර්මාන්ත කරුවන්ගේ ජීවිකාව අහිමිකළ බවත්, එම නිසා ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බව දන්වන ලදී. එහෙත් වෙරළ තීරය සංරක්ෂණය වෙනුවෙන් වෙරළසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝග මත පොලිසියේ ද සහයෝගයෙන් එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරිමට කටයුතු කළ බව දැනුම් දෙන ලදී. එහෙත් එළඹෙන කාලසීමාව තුළ සංචාරකයන් විශාල වශයෙන් මෙම ප්‍රදේශයට පැමිණෙන බැවින් මෙම සුළු කර්මාන්තකරුවන් වෙනුවෙන් සානුකම්පිතව බලා පොලිසියේ | කිසිදු ඉදිකිරීමකින් තොරව මාසයක පමණ කාලයක් සඳහා තාවකාලික කුඩයක් හා **Sunbed** එකක් භාවිතා කර සංචාරකයින් සඳහා පහසුකම් සැපයීමටත්, වෙරළ තීරය ප්‍රියමනාප ලෙස පවත්වා ගෙන යාමටත් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී. එසේම, දකුණු පළාත තුළ වෙරළ තීරයේ ආරක්ෂාව හා සුන්දරත්වයත් වැඩිදියුණු කර ගනිමින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමේදී දකුණු පළාතටම පොදු වෙරළ සංරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම සුදුසු බව පැහැදිලි කරන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල<br><br>ප්‍රාදේශිය ලේකම් , තගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ, වෙරළ පාරිසරික මධ්‍යස්ථානය, හම්බන්තොට<br><br>ප්‍රාදේශිය කළමණාකරු, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, හම්බන්තොට<br><br>ලේකම්, ප්‍රාදේශි සභාව - තංගල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අධීක්ෂණය යටතේ කිසිදු ඉදි කිරීමක් සිදු නොකර තාවකාලිකව තබා ගතහැකි කුඩයක් සහ **Sunbed** එකක් පමණක් තබා ගනිමින් මාසයක් පමණ කාලයකට හෝ සංචාරක සේවා සැපයීම සඳහා මෙම කර්මාන්තකරුවන්ට අවස්ථාව ක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී. | | |
| 29 | නාකුළුගමුව පහළයාය ඇල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ලබා ගැනීම. | නිවැරදි අනුමැතියකින් තොරව ගිණුමෙන් මුදල් ලබාගෙන කටයුතු කිරීම තුළ මෙම ගොවි සමිතියේ ගිණුම අත්හිටුවා ඇති බවත් මේ වන විට අවවාද කර ගිණුම නිදහස් කර ඇති බවත් මෙකී ගොවි සමිතියට ආසන්න වෙනත් ගොවි සමිතියකට මෙම කොන්ත්‍රාත්තුව දැනට ලබා දී ඇති බව පැහැදිළි කරන ලදී. | දැන හෝ නොදැන සිදුවූ වැරැද්ද හේතුවෙන් මාස 6 ක කාලයකට මෙම ගොවි සමිතිය මුදා හරිමින් ඉන් ඉකුත් කාලයෙන් පසු සාමාන්‍ය පරිදි අවශ්‍ය කටයුතු කරගෙන යාමට ගොවි සමිතියට අවසර දෙන ලදී. | සහකාර කොමසාරිස් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| 30 | 2024 විමධ්‍යගත යෝජනා ඉදිරිපත් කිරීම - ගරු හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී , දිලිප් වෙදආරච්චි මැතිතුමා | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 සඳහා රු.මි. 50ට අදාළව ඉදිරිපත්වී ඇති යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන දැනුම් දෙන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව යෝජනා අනුමැතිය සඳහා වෙන් කර තිබූ කාලසීමාවෙන් පසු මෙම යෝජනා ඉදිරිපත් වී ඇති බැවින් අනුමත කිරීමේ හැකියාවක් නොමැති බව දන්වන ලදී. | දිස්ත්‍රික් ලේකම් අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 31 | ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිවල රැස්වීම් හා නිලවරණ පැවැත්වීම | පවුල් 4000කට ආසන්න ප්‍රතිලාභීන් පිරිසක් සිටින තලාව මහසෙන් ප්‍රජා ජල ව්‍යාපෘතියේ නිලවරණය පැවැත්වීම විධිමත්ව සිදුවී නොමැති බවට කරුණු ඉදිරිපත් විය. නමුත් විධිමත් පරිදි මෙහි නිලවරණය මාර්තු මාසයේ පැවැත්වූ බවත් දිගින් දිගටම එකම කණ්ඩායමක් නිලධාරී ලෙස පත්වීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. | නිලධාරී මණ්ඩලය තෝරා ගැනීමේදී වසර ගණනාවක් එකම කණ්ඩායම පත්වීම වෙනුවට උපරිම වසර දෙකක කාලයකින් පසු නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම සුදුසු බවට තීරණය විය. | ස්ථාන භාර නිලධාරී ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

එච්.පී සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2024 මාර්තු මස ..08....................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CamScanner